## චීනය

ඉන්දියාවේ හා ජපානයේ ඉතිහාසය අධ්‍යයනය කළ අප ඊළඟට යොමු වන්නේ චීන ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයක් අධ්‍යයනය කිරීම සඳහා ය.

> "රටවලට නිදහස අවශ්‍ය යි. ජාතීන්ට විමුක්තිය අවශ්‍ය යි. ජනතාවට විප්ලවය අවශ්‍ය යි."
>
> - හිටපු අගමැතිවරයෙකු වූ චෞ - එන් - ලායි -

## චීනයේ ජාතිකවාදය හා කොමියුනිස්ට් වාදය

දීර්ඝ කාලයක් තිස්සේ පැවති දේශපාලන වියවුල්වලින් පසුව ක්‍රි.ව 1911 දී මැන්චූ රාජවංශය බලයෙන් පහවූයේ චීන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරමිනි. චීනයේ සම්ප්‍රදායික ආයතන හා සංස්කෘතිය චීන ඉතිහාසයේ කවර කලකවත් දක්නට නොලැබූ ආකාරයෙන් සීඝ්‍ර විපර්යාසයකට භාජනය විය. චීන විප්ලවය එක පිට එක ඇති වූ සිදුවීම්වලින් ගහණ වූ ප්‍රධාන අවස්ථා හතරකට වෙන් කළ හැකි ය.

01. (1912-1916) දක්වා වූ යුවාං-ෂි-කායිගේ සමූහාණ්ඩු කාලය
02. (1916-1922) දක්වා වූ යුද්ධ නායකයන්ගේ පාලනය හා මධ්‍යම රජය දුර්වල වීම
03. 1923 - 1949 දක්වා ජාතිකවාදී විප්ලවය
04. 1930 දශකයේ දී ප්‍රබල ලෙස නැඟී සිටි කොමියුනිස්ට් විප්ලවය

01. මැන්චූ පෙළපත බලයෙන් පහවීමෙන් පසු නැවත මධ්‍යම ආණ්ඩුව ස්ථාවර තත්ත්වයකට පත් කිරීමට චීන සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස සැලකෙන යුවාං-ෂි- කායි ප්‍රයත්න දැරූ නමුත් එය අසාර්ථක විය. එසේ වුව ද යුවාං-ෂි-කායි 1916 දී මරණයට පත් වූ පසුවත් ඔහු චීන සමාජයේ ප්‍රබල බලවේගයක් විය.

02. යුවාං-ෂි-කායිගෙන් පසුව ඔහුගේ නිලධාරීන්ට පීකිං නගරය අවට ප්‍රදේශයේ චීන සමූහාණ්ඩුව පවත්වාගෙන යාමට හැකි වුව ද සෙසු ප්‍රදේශ යුද නායකයන්ගේ පාලනය යටතට පත් විය. මෙම යුද නායකයන් අතුරින් ඇතැම් අය මැන්චූ පාලන අවධියේ සිටි නිලධාරීන් වූ අතර තවත් අය සොල්දාදුවෝ වූහ. ඔවුහු අනුකම්පා විරහිතව මහජනතාව තළා පෙළා අධික බදු අය කරමින් පාලනයක් ගෙන ගියහ. එ මඟින් රට තුළ ඉතා කලහකාරී හා ව්‍යාකූල මෙන් ම දරුණු තත්ත්වයක් පැවති බැවින් චීන ජනතාව අන්ත දුගී තත්ත්වයකට පත්ව සිටියහ.

පළමු වන ලෝක සංග්‍රාමය පැවති කාලය චීනයේ අභ්‍යන්තර වියවුල් ගහණ සමයක් විය. මේ අවස්ථාවේ දී චීනය මිත්‍ර පාක්ෂිකයන්ට එකතු වී ජර්මනියට එරෙහි ව යුද ප්‍රකාශ කෙළේ ය. සමුහාණ්ඩුවාදීන්ගේ අපේක්ෂාව වූයේ සාම ගිවිසුමක් ඇති කොට ගෙන රටේ අභ්‍යන්තර අවුල් වියවුල් සමනය කිරීමයි. එසේ වුව ද මහා සංග්‍රාමයෙන් පසු ව පැරිස් සාම සම්මේලනයේ දී චීනය ඉදිරිපත් කළ යෝජනා මුළුමනින්ම නොසලකා හැරිණි.

03. චීන විප්ලවයේ තුන්වන අවස්ථාව උදා වන්නේ ආචාර්ය සුන්- යත් -සෙන්ගේ පෞරුෂය සහ ඔහුගේ වැඩ පිළිවෙළ චීනය තුළ ක්‍රියාත්මක වීමත් සමඟ ය. ආචාර්ය සුන්-යත් සෙන්ගේ නායකත්වය යටතේ වූ ක්වෝමිංටාන් පක්ෂයේ ඉලක්කය වූයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය කරා යාම යි. විවිධ ප්‍රදේශවල පැවති යුද නායකයන්ගේ පාලනය දැඩිව විවේචනයට ගොදුරු වූ නමුත් ඔහුගේ පක්ෂය ද රඳා පැවතියේ යුද නායකයන්ගේ ආධාර මත ය. චීනයේ පවතින වගකීමකින් තොර යුද්ධ නායකයන්ගේ පාලනය නිසා චීනයේ බොහෝ ප්‍රදේශ විනාශයට පත්ව තිබිණි. ක්වෝමිංටාන් පක්ෂය ද එතරම් ශක්තිමත් නොවූ අතර එය පදනම් කොට ගත් දර්ශනය ද ප්‍රායෝගික නොවී ය. එසේ වූයේ එය අන්තගාමී ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වලින් යුක්ත වූ බැවිනි. ඒ නිසා හමුදා නායකයන් විසින් විනාශයට පත් කරමින් තිබූ චීනය තුළ ස්ථාවර තත්ත්වයක් ගොඩ නැඟීම ක්වෝමිංටාන් පක්ෂය සමඟ සුන්-යත්-සෙන්ට කළ හැකි වේ ද යනු සැක සහිත විය. එසේ වුව ද අවසානයේ සුන්-යත්-සෙන්ට සෝවියට් රුසියාවේ ආධාර ලැබීම නිසා තත්ත්වය යහපත් අතට හැරිණි.



රූපය 3.8
සුන් -යත් සෙන් මහතා

රුසියාවේ බෝල්ෂෙවික් පක්ෂයට ක්‍රි.ව. 1917 විප්ලවයෙන් පසුව බලය තහවුරු කර ගැනීමට මහ බලවතුන්ගේ සහාය අවශ්‍ය විය. ඒ අනුව විප්ලවකාරී චීනයේ සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු විය. පීකිං රජයෙන් සාර්ථක ප්‍රතිඵල නොලැබුණ නිසා රුසියාව කැන්ටන් ප්‍රදේශයේ බලය පිහිටුවාගෙන සිටි ආචාර්ය සුන්-යත්-සෙන්ගේ සහාය පැතීය. ක්‍රි.ව 1923 දී රුසියානු නියෝජිතයෝ චීනයට පැමිණි අතර එහි දී සුන්-යත්-සෙන් ගේ කැන්ටන් රජයට රුසියානු සහාය ලබා ගැනීමේ එකඟතාවට පැමිණියහ. චීනයේ ක්ෂණික අවශ්‍යතාව වූයේ ජාතික ඒකාබද්ධතාව ලබා ගැනීම යි. ඒ සඳහා උපදෙස් සැපයීමට සෝවියට් දේශයේ යුද්ධමය හා දේශපාලන උපදේශකවරු කැන්ටනයට පැමිණියහ.

මොස්කව්-කැන්ටන් සංහිඳියාව පැවති ක්‍රි.ව. 1923-27 කාලයේදී චීන ජාතිකවාදී ව්‍යාපාරයට විනයගරුක නායකත්වයක් ලැබිණි. ඒ සමඟ ම පැහැදිලි අරමුණු ද ලැබිණි. එපමණක් නොව සැහෙන පමණ ජන පදනමක් ද ගොඩ නැගිණි.

එවක චීනයේ පැවති හමුදා කල්ලිවල පාලනය අතිශය දූෂිත වූ අතර එම පාලනය ජනතාවට අප්‍රසන්න විය. පැරිස් සාම ගිවිසුම අත්සන් කිරීමේ දී චීනය අවමානයට පත් කිරීම හේතු කොට යථාර්ථය පැහැදිලි වූයෙන් තරුණ බුද්ධිමතුන් තුළ දේශාභිමානී හා විප්ලවකාරී හැඟීම් වර්ධනය විය. යැංසි නිම්නයේ කර්මාන්තශාලා ආශ්‍රිත ව කම්කරු ව්‍යාපාර, වෘත්තීය සමිති ව්‍යාපාර, ගොවිජන ව්‍යාපාර, තරුණ ව්‍යාපාර හා කාන්තා විමුක්ති ව්‍යාපාර පැන නැගිණි. එකිනෙකට ප්‍රතිවිරුද්ධ මත දැරුවා වුව ද සියලු දෙනාට අවශ්‍ය වූයේ චීනයේ ජාතික රජයක් ගොඩ නගා චීනය ශක්තිමත්, බලවත් හා ආර්ථික වශයෙන් සෞභාග්‍යමත් තත්ත්වයකට පත් කිරීම ය.

සෝවියට් උපදේශකවරු සුන්-යත්-සෙන්ට හා ඔහුගේ අනුගාමිකයන්ට මනා නායකත්වයක් ලබා ගන්නා අයුරු පැහැදිලි කෙරිණි. මයිකල් බොරෝඩින් නමැති සෝවියට් උපදේශකවරයා පවසා සිටියේ ක්වෝමිංටාන් පක්ෂය සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ ආකාරයට ගොඩ නැගිය යුතු බව ය. පක්ෂයේ ප්‍රචාරක කටයුතුවල දී පහත දැක්වෙන කරුණු වෙත අවධානය යොමු විය.

- හමුදා නායකයන්ගේ පාලනය ඉවත් කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදි අවංක දේශපාලනඥයන් පත් කොට ගැනීම
- අවි පරිහරණය අත්හිටුවීම

මෙම අරමුණු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටර්, චිත්‍ර හා උද්ඝෝෂණ ව්‍යාපාර යොදා ගැනිණි.

ක්‍රි.ව. 1925 වන විට කුඩා වුවත් සුන්-යත්-සෙන්ගේ නායකත්වය යටතේ වූ කැන්ටනය ප්‍රබල රජයක් විය. බදු අය කිරීම, වාණිජ ව්‍යාපාර, නව පන්නයේ හමුදාවක් ස්ථාපිත කිරීම, හමුදාව පුහුණු කිරීම යනාදිය බටහිර උපදේශකයන්ගේ අධීක්ෂණය යටතේ සිදු විය. කැන්ටන් රජය ඇත්ත වශයෙන් ම කොමියුනිස්ට් නොවන සෝවියට් ක්‍රමයකි. කැන්ටන් රජයේ ප්‍රබලතා ලෝකයට පෙන්නුව ද සෙසු බලවතුන් කැන්ටන් රජය නීත්‍යානුකූල රජයක් ලෙස පිළිගත්තේ නැත. සෝවියට් දේශය වුව ද චීනයේ නීත්‍යානුකූල රජය ලෙස පිළිගෙන සම්බන්ධතා පැවැත් වූයේ පීකිං රජය සමඟයි. එසේ වුව ද සෝවියට් දේශය නිරතුරුව ම පීකිං රජය පෙරළා දැමීම සඳහා සුන්-යත්-සෙන් ට ආධාර සැපයී ය. ප්‍රතිඵලය දැකීමට ආචාර්ය සුන්-යත්-සෙන් ජීවත් නොවූ නමුත් ඔහුගේ දර්ශනය පක්ෂයේ උරුමයක් වශයෙන් ඉතිරි විය. ආචාර්ය සුන්-යත්-සෙන් ගේ ලියවිලි ගොනු කොට ක්වෝමිංටාන් පක්ෂයේ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනිණි. ඔහුගේ ධර්මය "සන්-මින්-චු" නමින් ප්‍රකාශයට පත් වූ අතර එය ක්වෝමිංටාන් පක්ෂයේ අත්පොත බවට පත් විය.

සුන්-යත්-සෙන් ගේ මතවාදය අනුව සකස් වූ ක්වෝමිංටාන් පක්ෂයේ දර්ශනය ප්‍රධාන අංග තුනකින් යුක්ත විය.

ඒවා නම්

- ජාතිකවාදය ප්‍රජාතන්ත්‍රවාදය හා ජීවනවෘත්තිය යි.
- ජාතිකවාදය : යනුවෙන් අදහස් කෙළේ විදේශීය බලවේගවලින් චීනය නිදහස් කොට ගැනීම ය. ඒ අනුව ජනතාව රජයට භක්තිමත් විය යුතු ය.
- ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අදහස් කෙළේ ජනතා පරමාධිපත්‍යය හා නියෝජිත ආණ්ඩුක්‍රම පවත්වාගෙන යාමයි.
- ජීවන වෘත්තීය යනුවෙන් අපේක්ෂා කෙළේ භෞතික සංවර්ධන සහ සමාජීය ප්‍රතිසංස්කරණයි. මාක්ස්වාදය ප්‍රතික්ෂේප කළ සුන්-යත්-සෙන් මේ අංශයේ දී කිසියම් ප්‍රායෝගික වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීමට අසමත් විය.

**ආචාර්ය සුන්-යත්-සෙන් ට අනුව විප්ලවයේ අවස්ථා තුනකි.**

01. යුද්ධමය අවස්ථාව : රටේ නීතිය ස්ථාපිත කිරීම සඳහා බලය පාවිච්චි කිරීම.

02. භාරකාර අවස්ථාව : ජනතාව පුහුණු කිරීම, විප්ලව නායකයන්ට ගෞරවාචාර දැක්වීම.

03. ව්‍යවස්ථාව සකස් කිරීමේ අවස්ථාව : නියෝජන ක්‍රමය පදනම් කොට ගත් ව්‍යවස්ථාවක් සකස් කිරීම.

නායකයකු හා චින්තකයකු වශයෙන් ආචාර්ය සුන්-යත් සෙන් තුළ අඩුපාඩු තිබුණ ද ඔහු හැඳින්වූයේ "විප්ලවයේ පියා" වශයෙනි. ක්‍රි.ව. 1924 දී මරණයට පත්වන විට උතුරු චීනයේ යුද නායකයන් තිදෙනෙකු අතර පැවති ගැටුම් සමනය කිරීම සඳහා එහි ගොස් සිටියේ ය. ඒ වන විට ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහෙමින් පැවතිණි. සුන්-යත්-සෙන් දර්ශනය සිතුවාට වඩා බලවත් විය. සුන්ගේ අනුගාමිකයන්ට ඔහු වීරයෙක් විය. ලෝකය පුරා සිටි චීන ජනතාව සමූහාණ්ඩු ව්‍යවස්ථාවක් යටතේ නව රජයක් බිහිවන තුරු බලා සිටියහ. ආචාර්ය සුන්ගේ අදහස වූයේ චීනයේ සාම්ප්‍රදායික අපේක්ෂාව නව විද්‍යාත්මක චින්තනය සමග කලතා නව තාක්ෂණයක් බිහි කිරීම ය.

ක්‍රි.ව. 1926 පමණ වන විට කැන්ටන් රජය උතුරු දිග බලය පිහිටුවාගෙන සිටි නායකයන්ට අභියෝග කිරීමට තරම් ශක්තිමත් විය. ක්වෝමිංටාන්ගේ සේනාවට යුද නායකත්වය දීම සඳහා චියැං-කායි-ෂෙක් නම් (1888-1975) තරුණ ජනරාල්වරයකු පත් කොට තිබිණි. ප්‍රථමයෙන් ම යැංග්සි නිම්නයේ යුද නායකයන් පරාජය කරන ලදී. ඉන් පසු එක දිගට ම එල්ල කළ ප්‍රහාරවලින් පළාත් ගණනාවක බලය ව්‍යාප්ත කරනු ලැබී ය. මේ ප්‍රහාර මාලාව "දඬුවම් දීමේ ප්‍රයාණය" යනුවෙන් හැඳින්විණි.

මෙම ජයග්‍රණයත් සමඟ පක්ෂය තුළ කලක් තිස්සේ පැවති මත ගැටුමක් ඉස්මතු විය. පක්ෂයේ කොන්සවැටිව් මත දැරූ පිරිස එහි සිටි කොමියුනිස්ට්වරුන් නෙරපා දැමීමට යුහුසුළු වූහ.

ක්වෝමිංටාන්වරු රැඩිකල්වාදි නොවූහ. විදේශීය රටක බලපෑම් තම රටට ගෙනෙනවාට ඔව්හු විරුද්ධ වූහ. ක්‍රි.ව. 1927 දී ක්වෝමිංටාන් පක්ෂයේ සිටි රැඩිකල්වාදීන් ඉවත් කිරීමෙන් පසුව චියැං-කායි-ෂෙක් චීනය පුරා තම බලය ව්‍යාප්ත කිරීම සඳහා සියලු කටයුතු සංවිධානය කෙළේ ය. ඔහු පක්ෂයේ අසහාය නායකයා විය. මිලිටරි නායකයන්ගේ ප්‍රදේශ ඔස්සේ තම සේනා මෙහෙය වූ චියැං-කායි-ෂෙක් වැඩි අපහසුවක් නැතිව ක්‍රි.ව. 1928 දී පීකිං නගරය අල්ලා ගත්තේ ය. ඊ ළඟට චියැං-කායි-ෂෙක්ගේ සේනා නැන්කින් අල්ලා ගත් අතර එය තම අගනුවර බවට පත් කොට ගත්තේ ය.

ක්වෝමිංටාන්වරුන් විසින් මෙසේ ප්‍රදේශ විශාල ප්‍රමාණයක් අත් පත් කොට ගනු ලැබූ නමුත් දිගින් දිගට ම ඒවා පවත්වාගෙන යාම ඉතා දුෂ්කර කාර්යයක් බව පෙනිණි. ජාතිය ගොඩ නැඟීමේ කාර්ය ඔවුන්ට පැවරී තිබිණි. බලය අල්ලා ගැනීමට පෙර තිබූ තත්ත්වයට වඩා බලය අල්ලා ගැනීමෙන් පසු තත්ත්වය සහමුලින් වෙනස් විය. තවමත් චීනයේ මිලිටරිවාදීන්ගේ පාලනයේ සුන්බුන් තැන් තැන්වල පැවතිණි. ක්වෝමිංටාන් පක්ෂයේ බලය තවමත් පැවතුණේ යුද හමුදාව මත ය.

චියැං-කායි-ෂෙක් යටතේ ජාතිකවාදී ක්වෝමිංටාන්වරුන් නැන්කින්හි බලය පිහිටුවාගෙන අගය කළ හැකි සේවා කිහිපයක් ඉටු කළහ. 18 වැනි සියවසෙන් පසු චීනයේ විශාල කොටසක බලය අල්ලාගෙන ඒකාබද්ධ පාලනයක් ගෙන යාමට හැකි වූයේ චියැං-කායි-ෂෙක් පාලන සමයේදී ය. චීනයේ කීර්තිමත් නාමය ලොව පුරා පැතිරී ගියේ ෂෙක් ගේ පාලන සමයේදී ය. ජාතිකවාදින්ගේ රජය ඉතා ඉක්මණින් ලොව පුරා පිළිගැනීමක් ඇති කර ගත් අතර රටවල් රැසක් සමඟ තානාපති සබඳතා ඇති කොට ගැනීමට ද සමත් විය. ඇමරිකා එක්සත් ජනපදය සහ අනෙකුත් බලවත් රටවල් චීනයේ වෙළෙඳාම සඳහා පනවා තිබූ බඳු ඉවත් කිරීමට තීරණය කළහ.

විසිවසරක පාලනයෙන් පසු ක්වෝමින්ටාංවරුන්ගේ බලය බිඳ වැටිණි. මීට බලපෑ හේතු තුනකි.

1. චීන ජන සමාජයේ ගැටලු විසඳීමට අසමත් වීම
2. චීන කොමියුනිස්ට්වාදින් බලවත් වීම
3. ක්‍රි.ව. 1937 දී ජපානය චීනය ආක්‍රමණය කිරීම

ක්වෝමිංටාන්වරු බලය අල්ලා ගෙන සිටි කාලයේ කොමියුනිස්ට්වාදීන් මර්දනය කළහ. දෙපක්ෂය අතර මත භේද උග්‍රවන විට කොමියුනිස්ට්වාදීහු සැඟවී ගියහ. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල විශේෂයෙන් ම මධ්‍යම හා දකුණු චීනයේ තම කටයුතු දිගට ම කරගෙන යාමට කොමියුනිස්ට්වරු සමත් වූහ. එපමණක් ද නොව කැන්ටන් රජයට එරෙහිව කියැංසි පළාතේ සෝවියට් ආකාරයේ විකල්ප රජයක් පිහිටුවා ගැනීමට ද ඔවුහු සමත් වූහ. ක්වෝමිංටාන්වරුන් විසින් නිතර නිතර කොමියුනිස්ට් මධ්‍යස්ථාන වලට පහර දීම නිසා තම ජීවිත පරදුවට තබා ක්වෝමිංටාන්වරුන්ට එරෙහිව සටන් කිරීමට කොමියුනිස්ට්වරුන්ට සිදු විය. පීඩාවට පත්ව සිටි ගොවි ජනතාවට ගරිල්ලා